*සියලු ම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 7 | විෂයය Subject: නාට්‍ය හා රංග කලාව | කාලය Time: පැය 1 1/2 |

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 සිට 5 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. පෙර සූදානමකින් තොරව සිදුකරන රංගනය හඳුන්වන්නේ,
    1. අභිරූපණය 2. සමාරෝපය
    3. අනුකරණය 4. ක්ෂණික නිරූපණය

02. නාට්‍ය පිටපතක නළු නිළියන්හට දෙනු ලබන උපදෙස් හඳුන්වන්නේ,
    1. රංග විධාන 2. චරිත 3. කතා පුවත 4. සංවාද

03. වේදිකා නාට්‍ය අයත් වන්නේ මින් කුමන කලාවකට ද ?
    1. ශ්‍රව්‍ය දෘශ්‍ය 2. දෘශ්‍ය 3. ශ්‍රව්‍ය 4. මුද්‍රිත කලා

04. අමර ගියා දිවිය ලෝකේ නාට්‍ය රචකයා වන්නේ,
    1. ඩී. කුමාරගේ 2. පාලිත ලොකුපෝතාගම
    3. සෝමලතා සුබසිංහ 4. අමිතා රබ්බිඩිගල

05. ළමා නාට්‍යක් නොවන්නේ මින් කුමක්ද ?
    1. පුංචි අපිට දැන් තේරෙයි. 2. තලමල පිපිලා
    3. හිම කුමාරි 4. නෙළුම් කුමාරි

- **6-10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද යොදන්න.**

06. සිරිත් විරිත් ඇතුළත් ග්‍රන්ථයක් ලෙස සිරිත් මල්දම හැඳින්විය හැක. (   )

07. වර්තමානයේ බහුලව භාවිතා වන රංග භූමියක් වන්නේ ප්‍රොසීනියම් වේදිකාවයි. (   )

08. කතන්දරවල විවිධ චරිත නැත. (   )

09. පන්ති කාමර නාට්‍යවල නාට්‍යමය ලක්ෂණ දක්නට ඇත. (   )

10. සාර්ථක රංගනයක් සඳහා පෙරසූදානමක් අවශ්‍ය නැත. (   )

- **11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යා කරන්න.**

| | | |
|---|---|---|
| 11. | මුල, මැද, අග සහිතව ගොතා තිබීම. | ශිථිලකරණ |
| 12. | කුතුහලයක් තිබීම. | ක්ෂණික නිරූපණය |
| 13. | පිටපතක් නොමැති රංගනය | කතාන්දර |
| 14. | වෙද පුටුව රංග අභ්‍යාසය | නාට්‍යෝචිත අවස්ථා |
| 15. | ශරීරය සැහැල්ලු කිරීම | පරිකල්පනය |

- **16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

16. ................................... කතන්දර ගොතමු.

17. නාට්‍යයක ................................... තුළින් ගැඹුරු ජීවිතාවබෝධයක් ලැබේ.

18. ................................... අධිමානුෂ චරිතයකි.

19. චරිතයක ................................... ප්‍රකාශනය මනාව සිදුවිය හැක.

20. අංග චලන මගින් අදහස් ප්‍රකාශනය ................................... අභිනය වේ.

**(හැඟීම් , කිඳුරා , ආංගික , තේමාව , සාමූහිකව)**

(ල.2 x 20 = 40)

## II කොටස

- **ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

1). (i). රංග භූමියක් යනු කුමක්ද ?

(ii). රංග භූමි වර්ග 3 ක් ලියන්න.

(iii). රංග භූමියක තිබිය යුතු ලක්ෂණ මොනාවාදැයි විස්තර කරන්න.

(2 + 3 + 5 = 10)

2). (i). රංග අභ්‍යාස යනු කුමක්ද ?

(ii). රංග අභ්‍යාස 3 ක් නම් කරන්න.

(iii). ඉන් එක් රංග අභ්‍යාසයක් සිදුකරන ආකාරය පැහැදිලි කරන්න.

(2 + 3 + 5 = 10)

3). (i). නාට්‍යක තේමාවක් යනු කුමක්ද ?

(ii). ඔබ දන්නා ළමා වේදිකා නාට්‍ය 2 ක් ලියන්න.

(iii). ඔබ ලියන ලද ළමා නාට්‍ය දෙකෙහි තේමාව ලියන්න.

(2 + 3 + 5 = 10)

4). (i). විද්‍යුත් මාධ්‍ය 2 ක් නම් කරන්න.

(ii). රූපවාහිනියේදී ඔබ දකින වේදිකා නාට්‍ය පිළිබඳව විස්තර සඳහන් වැඩසටහන් 3 ක් ලියන්න.

(iii). විද්‍යුත් මාධ්‍යක හා සජීවී මාධ්‍යයෙන් දකින වේදිකා නාට්‍යවල ඇති අසමානතා මොනවාද?

(2 + 3 + 5 = 10)

5). (i). වේෂ භූෂණ යනු කුමක්ද ?

(ii). වේෂ භූෂණ නිර්මාණයේදී සැළකිලිමත් විය යුතු කරුණු 3 ක් ලියන්න.

(iii). පහත සඳහන් රංග ආභරණ නිර්මාණයේදී එය සිදුකරන ආකාරය පැහැදිලි කරන්න.

- තැල්ල
- ඉනහැඩය (2 + 3 + 5 = 10)

6). ඔබ කැමති ජන කතාවක් ඇසුරෙන් නාට්‍ය පිටපතක් (නාට්‍ය පෙළක්) රචනා කරන්න.

- නාට්‍යයේ චරිත
- රංග විධාන
- නාට්‍යෝචිත අවස්ථා ඇතුළත් විය යුතුයි (ල. 10)